මගේ අංකය:ධීජසදෙ/ආ/01/11/වි.පු/ කමිටු රැස්වීම 2023

පාලන අංශය

2025.01.22

අධ්‍යක්ෂ(තොරතුරු තාක්ෂණ)

**<u>විදේශ පුහුණු සහ ශ්‍රී ලංකාව නියෝජනය සඳහා විදේශ සමුළුවලට සහභාගීවීම සම්මත තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය.</u>**

ඉහත කරුණට අදාළව මගේ සමාංක 2025.01.22 දිනැති ලිපියේ පිටපතක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

02.එම ලිපිය ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළකිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

අයේෂා උදයන්ති පතිරණ

අධ්‍යක්ෂ(පාලන)

ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වෙනුවට

**ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**
கடற்றொழில் நீரியல் வளத்துறை திணைக்களம்
DEPARTMENT OF FISHERIES & AQUATIC RESOURCES

web site : http://www.fisheriesdept.gov.lk E - mail : info@fisheriesdept.gov.lk
புதிய செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10, இலங்கை නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10, ශ්‍රී ලංකාව New Secretariat,Maligawaththa, Colombo 10

මගේ අංකය / எனது இல / My Ref } ධීජදෙ/ආ01/වි.පු/කමිටු [illegible]/202[illegible]
ඔබේ අංකය / உமது இல / Your Ref }
දිනය / திகதி / Date } 2025.01.22

ලේකම්
ධීවර ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

**<u>විදේශ පුහුණු සහ ශ්‍රී ලංකාව නියෝජනය සඳහා විදේශ සමුළු වලට සහභාගී වීම සම්මත තෝරාගැනීමේ ක්‍රියා පටිපාටිය</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ අංක ධීජදෙ/ආ01/11/වි.පු/IV/2024 හා 2024.12.24 දිනැති ලිපිය හා බැඳේ. එහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

02. ඒ අනුව, විදේශ පුහුණු සහ ශ්‍රී ලංකාව නියෝජනය සඳහා විදේශ සමුළු වලට සහභාගී වීමට නිලධාරීන්ව තෝරාගැනීමේ සම්මත ක්‍රියා පටිපාටිය පිළිබඳව සියලුම අංශ ප්‍රධානීන්/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් දැනුවත් කරන ලද අතර, සංශෝධන හෝ නවත් ඇතුළත් විය යුතු කරුණු ඉදිරිපත් කිරීම සඳහා 2024.12.24 දින සිට 2024.12.31 දක්වා කාලය ලබා දී තිබුණි. එහෙත්, මෙතෙක් ඒ සම්බන්ධයෙන් සංශෝධන හෝ නවත් ඇතුළත් විය යුතු කරුණු විදේශ පුහුණු කමිටුව වෙත ඉදිරිපත් වී නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.

03. එබැවින්, ඉදිරියේදී පුහුණු සහ ශ්‍රී ලංකාව නියෝජනය සඳහා විදේශ සමුළු වලට සහභාගී වීමට නිලධාරීන්ව තෝරාගැනීමේදී මෙම සම්මත ක්‍රියාපටිපාටිය අනුව කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

සුසන්ත කහවත්ත
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

සුසන්ත කහවත්ත
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
கடற்றொழில் நீரியல் வளத்துறை திணைக்களம்
DEPARTMENT OF FISHERIES & AQUATIC RESOURCES

web site : http://www.fisheriesdept.gov.lk E - mail : info@fisheriesdept.gov.lk
புதிய செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10, இலங்கை නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10, ශ්‍රී ලංකාව New Secretariat, Maligawaththa, Colombo 10

මගේ අංකය / எனது இல / My Ref } ධීසදෙ/ආ01/11/වි.පු/IV/2024 ඔබේ අංකය / உமது இல / Your Ref }
දිනය / திகதி / Date } 2024.12.27

සියලුම අංශ ප්‍රධානීන්/නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/සහකාර අධ්‍යක්ෂවරුන් වෙත,

**විදේශ පුහුණු සහ ශ්‍රී ලංකාව නියෝජනය සඳහා විදේශ සමුළු වලට සහභාගී වීම සඳහා තෝරාගැනීමේ ක්‍රියාපටිපාටිය**

ඉහත කරුණ සම්බන්ධයෙන් සකස් කරන ලද ක්‍රියාපටිපාටිය මේ සමඟ අමුණා ඇත.

02. එහි සඳහන් කරුණු වලට අමතරව තව දුරටත් ඇතුළත්විය යුතු කරුණු සහ සංශෝධන තිබේනම් 2024.12.30 දිනට පෙර විදේශ පුහුණු සම්බන්ධ කමිටු සභාපති වෙත යොමු කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

ඩබ්.පී. [illegible] කුමාර
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

අධ්‍ය. / பணிப். } 531
සාමාන්‍ය දුරකථන / பொது தொலைபேசி / Gen. Telephone } +94(0)112446183 (2 lines)
ෆැක්ස් / தொலைநகல் / Fax } +94(0) 1124491…

## විදේශ පුහුණු සහ ශ්‍රී ලංකාව නියෝජනය සඳහා විදේශ සමුළු වලට සහභාගී වීම සම්මත තෝරාගැනීමේ ක්‍රියා පටිපාටිය

1.0 ශ්‍රී ලංකාව නියෝජනය සඳහා විදේශ සමුළු වලට සහභාගී වීම

- ශ්‍රී ලංකාව නියෝජනය සඳහා විදේශ සමුළු වලට සහභාගී වීම යනු ඉතාම වගකීම් සහගත කටයුත්තක් වන අතර දෙපාර්තමේන්තුව වෙනුවෙන් වග කියනු ලබන දෙපාර්තමේන්තුවේ ඉදිරි කටයුතු සඳහා සක්‍රියව සහභාගී වීමේ විභවයක් සහිත නිලධාරීන් මේ සඳහා සහභාගී වීම සුදුසු වේ. එමෙන්ම එම නිලධාරීන් අදාල සමුළු වලදී ධීවර දෙපාර්තමේන්තුව සහ මෙරට ධීවර කර්මාන්තයට පමණක් නොව රටේ ප්‍රතිචාරීත්වයට හානි නොවන කිසිවක් ප්‍රකාශ කරනු හෝ එලෙස ක්‍රියා නොකරනු ලබන බවට වග බල ගත යුතුය. එමෙන්ම එම සමුළුව හෝ වැඩමුළුවේදී ගන්න ලබන තීරණ වලට සක්‍රියව තම දායකත්වය ලබා දී ශ්‍රී ලංකාව වාසි සහගත තත්වයක් සහ තීරණ ලබාගන්නා බවට වග බල ගත යුතු වේ.
- ශ්‍රී ලංකාව නියෝජනය සඳහා විදේශ සමුළු වලට සහභාගී වීම දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරීන්ට පමණක් සීමා කිරීමෙන් වගකීමක් සහිතව එම සමුළු වලට නිලධාරීන්ට සහභාගී වීම තහවුරු කරයි.
- එමෙන්ම දෙපාර්තමේන්තුවේ ඉදිරි කටයුතු සඳහා සක්‍රියව සහභාගී වීමේ විභවයක් සහිත නිලධාරීන් සහභාගී විය යුතු බැවින් විශ්‍රාම ගැන්වීමට ආසන්න (වසර 59 හෝ ඊට ඉහළ) නිලධාරීන් එම සමුළු වලට සහභාගී කිරීම සුදුසු නොවේ.
- යම් නිලධාරියෙක් දිගින් දිගටම අදාල සමුළුවක් සඳහා සහභාගී වන්නේ නම් ඔහු/ ඇය විශ්‍රාම ගැනීමට වසර කිහිපයකට පෙර ඒසඳහා සුදුසු නවක නිලධාරියෙකු පුහුණු කිරීම සිදු කල යුතු වේ.
- එමෙන්ම නව විධායක නිලධාරීන් නිරතුරුව මෙවැනි සමුළු සඳහා සහභාගී වීමට පුහුණු කල යුතු වන අතර එක අයකුට වඩා වැඩි අවස්ථාවක් තිබෙන විට ශ්‍රී ලංකාව නියෝජනය සඳහා විදේශ සමුළු වලට සහභාගී වීමේ දී නව විධායක නිලධාරීන්ටද අවස්ථාව ලබා දීම සුදුසු වේ.
- ඉන්දියානු සාගර ටූනා කොමිසම (IOTC) සම්බන්ධ වැඩ පිළිවෙල ඉදිරියේදී මෙම සමුළුවලට සහභාගී වීම පමණක් නොව එම සමුළු සඳහා අදාල කරුණු ඉදිරිපත් කිරීමේදී හෝ එම සමුළු වලට අදාල රාජකාරීන් ඉටු කිරීම සඳහාද අදාල දිස්ත්‍රික්ක වලට ප්‍රමුඛත්වය ලබාදී අදාල ක්‍රියාකාරකම් එම දිස්ත්‍රික් වල ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කල යුතුය. උදාහරණයක් ලෙස Working Party on Billfish සඳහා සප්පර/ කොප්පරා වර්ගයේ මසුන් වැඩිපුර හසුවන දිස්ත්‍රික්කයන් සම්බන්ධ කර ගැනීම දැක්විය හැක.
- ඇමුණුම 1හි දැක්වෙන IOTCසමුළු ශ්‍රීලංකාවේ අනුකූලතා මට්ටමට ඉතා වැදගත් වන අතර ඒ සඳහා සඳහා විෂයානුබද්ධව නිලධාරීන් සහභාගී කරවිය යුතු වේ. එහිදී වඩා සුදුසුම අංශය හෝ දිස්ත්‍රික්කය තෝරාගත යුතුය. මෙහිදී දිස්ත්‍රික්භාර විධායක නිලධාරීන්ට හැකි සෑම විටම අවස්ථාව ලබාදිය යුතුවේ.

2.0 අනෙකුත් විදේශ පුහුණු

- මේ පුහුණු සඳහා විධායක නොවන නිලධාරීන්ට මූලිකත්වය ලබා දිය යුතු අතර එහිදී අදාල රාජකාරීන් ස්වභාවය සැලකිල්ලට ගත යුතුය.
- එමෙන්ම දීර්ඝකාලීනව දෙපාර්තමේන්තුවේ සේවය කර ඇති සහ අවස්ථාව අඩුවෙන් ලබා දී ඇති නිලධාරීන්ට ප්‍රමුඛත්වය ලබාදිය යුතුය.
- පුහුණුවේ ස්වභාවය සමග අදාල අංශයේ හෝ දිස්ත්‍රික්කයේ විශේෂ ලක්ෂණ ගලපා එම ගැලපීම මත සුදුසු නිලධාරියෙකු තෝරා ගත යුතුය.
- මාණ්ඩලික නිලධාරීන් වසර 57න් ඔබ්බට විදේශ පුහුණු සඳහා සහභාගී විය නොහැක.
- එක් විෂයකට අදාලව නිලධාරීන් කිහිපදෙනෙකු සහභාගීකරවීමට කටයුතු කළ යුතුය.
- තම අංශවල අදාල කටයුතු වලදී දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගතිශීලීව රාජකාරීන් ඉටු කරන නිලධාරීන් පිලිබඳ අවබෝධයක් තිබිය යුතු අතර එසේ රාජකාරි සඳහා වැඩි දායකත්වයක් ලබාදෙන නිලධාරීන් අදාල පුහුණු සඳහා නිර්දේශ කල හැක. (උදාහරණයක් ලෙස යාත්‍රා ලියාපදිංචිය වැඩිපුරම සිදුකල ධීවර පරීක්ෂක යාත්‍රා ලියාපදිංචි ක්‍රමවේද පිලිබඳ පුහුණුවක් සඳහා යොමු කල හැක)

- එක එක් අංශ වලට අදාල පුහුණු ලැබීමේ ප්‍රමුඛතා පිළිබඳ විස්තර ඇමිණුම 2 හි දැක්වේ

3.0 පොදු කරුණු

- විදේශ වැඩ මුළු වලට සහභාගී කිරීමේදී අදාල වසර තුල අදාල නිලධාරියා මෙවැනි වෙනත් වැඩමුළු වලට සහභාගී තිබේ ද යන්න සැලකිය යුතුය.
- විදේශ පුහුණු සඳහා නිලධාරියෙක්ට එක වසරක් සඳහා එක අවස්ථාවක් ලබාදීම යෝග්‍ය වේ.
- එමෙන්ම පුහුණු සහ වැඩමුළු සඳහා සහභාගී වීමට කැමති නිලධාරීන්ට ඒ සඳහා අයදුම් කිරීමට විවෘත අවස්ථාවක් ලබාදිය යුතු අතර සහභාගී වන නිලධාරීන් කවරේද යන්න පිළිබඳ අදාල හේතූන් සමග වන නිර්දේශය මෙම කමිටුව විසින් ලබා දෙන ලදුව අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කල යුතුය. අදාල අයදුම්පතේ ආකෘතියක් ඇමුණුම 3 ලෙස දක්වා ඇත.
- දෙපාර්තමේන්තුවට පමණක් අදාල වන විදේශ සමුළු සහ පුහුණු කවරේද යන්න මෙම කමිටුව විසින් හඳුනාගෙන අමාත්‍යාංශය වෙත දැනුම් දිය යුතු අතර එම විදේශ සමුළු සහ පුහුණු සඳහා නිලධාරීන් සහභාගී කරවීම දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ මත පමණක් සිදුකල යුතු බවට අමාත්‍යාංශය දැනුවත් කල යුතු වේ.
- විදේශ සමුළු සහ පුහුණු සඳහා සහභාගී වන නිලධාරීන් නැවත ලංකාවට පැමිණ සති දෙකක් ඇතුලත මෙහි ඇමුණුම 4 ආකෘතියට අනුව වාර්තාවක් කමිටුව වෙත ලබාදිය යුතු වේ. එම වාර්තාව යොමුකර නොමැති නිලධාරීන් නැවත විදේශ සමුළු සහ පුහුණු සඳහා සහභාගී කරවීමට සලකා බලනු නොලැබිය යුතුය
- ලබාදෙන වාර්තා මත පදනම්ව විනාඩි 10ක කෙටි ඉදිරිපත් කිරීමක් අදාල නිලධාරියා විසින් මෙම කමිටුව වෙත සිදුකල යුතු අතර එම ඉදිරිපත් කිරීම සඳහා සහභාගීකව හෝ මාර්ගගත ලෙස සහභාගී වීමේ අවස්ථාව දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ට ලබාදිය යුතුය.
- තමා ලබාගත් පුහුණුව හා වැඩමුළු ආශ්‍රයෙන් දෙපාර්තමේන්තුව වෙනුවෙන් තම අදහස් යෝජනා ඉදිරිපත් කිරීමට හා ඒ සම්බන්ධයෙන් සෙසු නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.
- දෙපාර්තමේන්තු ගත නොවන දීප ව්‍යාප්ත සේවා වලට අදාල නිලධාරීන් සඳහාද පුහුණු හා වැඩමුළු වලට සහභාගිවීමට අවස්ථාව හැකි සෑම විටම ලබාදිය යුතුය.
- විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වන නිලධාරීන්, නිලධාරියාගේ KPI වලින් තෝරාගැනීමට සලකා බලනු ලබන දිනට නියමිත ප්‍රමාණයෙන් අවම වශයෙන් 75% ක්වත් සපුරා තිබීම සලකා බලනු ලැබේ.

ඇමුණුම 1

| සමුළුවේ නාම සවභාවය | අදාල අංශය | අදාල දිස්ත්‍රික්කය/ හෝ ක්ෂේත්‍ර නිලධාරීන් |
|---|---|---|
| IOTC Commission | අධ්‍යක්ෂ ජනරාල්/ අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කරනු ලබන නිලධාරියෙකු | සියලු දිස්ත්‍රික් කාර්යාල වලටද අදාල වේ |
| Working Party on Socio-Economics (WPSE) | සංවර්ධන අංශය | සියලු දිස්ත්‍රික් කාර්යාල වලටද අදාල වේ |
| Compliance Committee | කළමනාකරණ අංශය<br>විමර්ශන අංශය<br>තත්ත්ව පාලන අංශය | |
| Standing Committee on Administration and Finance (SCAF | මුදල් අංශය<br>ආයතන අංශය | |
| Technical Committee on Allocation Criteria (TCAC)- | දත්ත සහ ධීවර කළමනාකරණය පිලිබඳ දැනුම/සුදුසුකම් ඇති විධායක නිලධාරියෙකු | සියලු දිස්ත්‍රික් කාර්යාල වලටද අදාල වේ |
| Scientific Committee (SC) | විද්‍යාත්මක ක්‍රම සහ දැනුම/ සුදුසුකම් ඇති විධායක නිලධාරියෙකු | සියලු දිස්ත්‍රික් කාර්යාල වලටද අදාල වේ |
| Working Party on Billfish (WPB) | කළමනාකරණ අංශය<br>මෙහෙයුම් අංශය<br>තත්ත්ව පාලන අංශය | වැඩිම Billfish මත්ස්‍ය අස්වැන්නක් ඇති දිස්ත්‍රික් කාර්යාල |
| Working Party on Tropical Tunas (WPTT) - Management/ | කළමනාකරණ අංශය<br>තත්ත්ව පාලන අංශය<br>මෙහෙයුම් අංශය | වැඩිම Tropical Tunaමත්ස්‍ය අස්වැන්නක් ඇති දිස්ත්‍රික් කාර්යාල |
| Working Party on Neritic Tunas (WPNT) - Management/ | මෙහෙයුම් අංශය | වැඩිම Neritic Tunaමත්ස්‍ය අස්වැන්නක් ඇති දිස්ත්‍රික් කාර්යාල |
| IOTC Working Party on the Implementation of Conservation and Management Measures (WPICMM)- | කළමනාකරණ අංශය<br>තත්ත්ව පාලන අංශය | වැඩිම මත්ස්‍ය අස්වැන්නක් ඇති දිස්ත්‍රික් කාර්යාල |
| Working Party on Data Collection and Statistics (WPDCS) | තොරතුරු තාක්ෂණ අංශය<br>කළමනාකරණ අංශය | වැඩිම මත්ස්‍ය අස්වැන්නක් ඇති දිස්ත්‍රික් කාර්යාල |
| Working Party on Ecosystems and Bycatch.(WPEB)- | කළමනාකරණ අංශය | ඉලක්ක නොකරන ජීවීන් වැඩි වශයෙන් වාර්තා වන (මෝරුන්/ කැස්බෑවන්) දිස්ත්‍රික් කාර්යාල |
| Working Party on Methods (WPM)- | කළමනාකරණ අංශය<br>මෙහෙයුම් අංශය<br>විමර්ශන අංශය | සියලු දිස්ත්‍රික් කාර්යාල වලටද අදාල වේ |
| Technical Meeting on the IOTC Regional Observer Scheme- | කළමනාකරණ අංශය<br>මෙහෙයුම් අංශය | යාත්‍රා නිරීක්ෂකයින් යොදවනු ලබන දිස්ත්‍රික් කාර්යාල |

ඇමුණුම 2

| අදාල අංශය | පුහුණුවේ සවභාවය |
|---|---|
| කළමනාකරණ අංශය | IUU ධීවර කටයුතු මැඩලීම, සාගර නීතිය, මත්ස්‍ය තොග සමීක්ෂණ, ධීවර කළමනාකරණ මෙවලම්, ධීවර දත්ත විශ්ලේෂණ, ධීවර නීති හා ධීවර නීති කෙටුම්පත්/ මත්ස්‍ය සම්පත් කලමනාකරණය, තොරතුරු තාක්ෂනය හා සම්බන්ධ නීති සහ කළමනාකරණ උපාංග |
| සංවර්ධන අංශය | ධීවර සමාජ ආර්ථික, මූල්‍ය, ධීවර තාක්ෂනය, පශ්චා ක්‍රම, සමුපකාර, තොරතුරු තාක්ෂනය හා සම්බන්ධ නීති සහ කළමනාකරණ උපාංග |
| තත්ත්ව පාලන අංශය | මත්ස්‍ය තොග සමීක්ෂණ, ධීවර කළමනාකරණ මෙවලම්, මත්ස්‍ය අපනයන හා තත්ත්ව පාලන |
| මෙහෙයුම් අංශය | මත්ස්‍ය තොග සමීක්ෂණ, ධීවර කළමනාකරණ මෙවලම්, ධීවර දත්ත විශ්ලේෂණ, යෝදිසි මෙහෙයුම්, ධීවර වරාය ආශ්‍රිත මෙහෙයුම් කළමනාකරණය, තොරතුරු තාක්ෂනය හා සම්බන්ධ නීති සහ කළමනාකරණ උපාංග |
| විමර්ශන අංශය | IUU ධීවර කටයුතු මැඩලීම, සාගර නීතිය ධීවර නීති හා ධීවර නීති කෙටුම්පත්, වැටලීම් හා අධිකරණ පටිපාටි, Digital forensics for fisheries, තොරතුරු තාක්ෂනය හා සම්බන්ධ නීති සහ කළමනාකරණ උපාංග |
| තොරතුරු තාක්ෂණ අංශය | ධීවර දත්ත විශ්ලේෂණ, Digital forensics for fisheries, යාත්‍රා නිරීක්ෂණ, දත්ත පද්ධති, මෘදුකාංග සංවර්ධනතොරතුරු තාක්ෂනය හා සම්බන්ධ නීති සහ කළමනාකරණ උපාංග |
| මුදල් අංශය | මුදල් පරිපාලන සහ මූල්‍ය විනය මුදල් පරිපාලනය සඳහා තොරතුරු තාක්ෂණ භාවිතාව |
| ආයතන හා පාලන අංශය | පරිපාලන කටයුතු, නිලධාරී මුහුණු කරන්නන්, කාර්යාල ක්‍රම සහ සඳහා තොරතුරු තාක්ෂණ භාවිතාව |
| අභ්‍යන්තර විගණන අංශය | විගණනය, විගණනය සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම, තොරතුරු තාක්ෂනය හා සම්බන්ධ නීති සහ කළමනාකරණ උපාංග |

ඉහත පුහුණු වැඩසටහන් සඳහා අදාල අංශය සමග සම්බන්ධව රාජකාරීන් සිදු කරන ඕනෑම ක්ෂේත්‍ර නිලධාරියෙකු තෝරා ගත හැක

ඇමුණුම 3

## Applying for overseas official or Training Programmes

## Department of Fisheries and Aquatic Resources

<table>
<tr><td>Name of the overseas official or training programme/s</td><td colspan="3"></td></tr>
<tr><td>Name and the designation of the applicant</td><td colspan="3"></td></tr>
<tr><td>Email address of the applicant</td><td colspan="3"></td></tr>
<tr><td>Phone number of the applicant</td><td colspan="3"></td></tr>
<tr><td>Relevancy of the officer who applying for the above programme</td><td colspan="3"></td></tr>
<tr><td>Qualifications of the officer relevant to the programme</td><td colspan="3"></td></tr>
<tr><td rowspan="3">Details of the other overseas programme participated by the applicant for this year</td><td>Progreamme</td><td>Is the progress report submitted</td><td>Is the knowledge gained incorporate with the process of DFAR</td></tr>
<tr><td></td><td></td><td></td></tr>
<tr><td></td><td></td><td></td></tr>
<tr><td>Objective of participating to the programme. What are the benefits wishes to acquire to Sri Lanka via the programme by the officer</td><td colspan="3">1.</td></tr>
</table>

Signature of the applicant ____________________

Name and the designation ____________________

Date - ____________

ඇමුණුම 4

## Report on overseas official or Training Programmes by the participants

## Department of Fisheries and Aquatic Resources

| | |
|---|---|
| Name of the overseas official or training programme/s | |
| Details of the programme (minimum 200 words) | |
| What are the interventions/ contribution by you (Sri Lanka) during the programmes (minimum 150 words) | |
| What are the benefit/ or potential benefit to the fisheries sector (minimum 200 words) | |
| What are your recommendations based on outputs of the programme(minimum 150 words | |

Signature of the applicant ____________________

Name and the designation ____________________ Date - ____________